HDLIM I/II 2025/2026

NILIS

# පුස්තකාල හා තොරතුරු කළමනාකරණ උසස් ඩිප්ලෝමාව
# Higher Diploma in Library and Information Management

## 1) හැඳින්වීම

පුස්තකාල හා තොරතුරු කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව සමත්වූ පාඨමාලාලාභීන්ට මෙම උසස් ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීමට හැකියාව ඇත. ඩිප්ලෝමා පාඨමාලාවෙන් ලද මූලික දැනුම වඩාත් ප්‍රබල වෙත්ම පුළුල් න්‍යායාත්මක සහ ප්‍රායෝගික මට්ටමකින් මෙම උසස් ඩිප්ලෝමාව තුළ අධ්‍යයනය කෙරේ.(මෙය I සහ II කොටස් වශයෙන් වසර දෙකක් පුරා පැවැත්වෙනු ඇත.)

## 2) ඉලක්ක කණ්ඩායම

මහජන හා පාසල් පුස්තකාලවල සේවය කරන හෝ එම පුස්තකාල කෙරෙහි උනන්දුවක් දක්වන ඕනෑම අයෙකු සඳහා

## 3) පාඨමාලාවට බඳවා ගැනීමේ සුදුසුකම්

| පුස්තකාල හා තොරතුරු කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව I (HDLIM I) | පුස්තකාල හා තොරතුරු කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව II (HDLIM II) |
|---|---|
| • **පුස්තකාල හා තොරතුරු කළමනාකරණ ඩිප්ලෝමාව(DLIM)** හෝ<br>• **මහජන පුස්තකාලයාධිපතිත්ව ඩිප්ලෝමාව (DPL)** හෝ<br>• **පාසල් පුස්තකාලයාධිපතිත්ව ඩිප්ලෝමාව (DSL)** සමත්වීම | **පුස්තකාල හා තොරතුරු කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව I (HDLIM I)** සමත්වීම |

## 4) ඉගෙනුම් ඵල

මෙම පාඨමාලාව හැදෑරීමෙන් පසු

- මුද්‍රිත සහ ඉලෙක්ට්‍රොනික මාධ්‍ය මැනවින් කළමනාකරණය කිරීමට
- ජනමාධ්‍ය සඳහා තොරතුරුවල වැදගත්කම අවබෝධ කරගැනීමට
- තොරතුරු කළමනාකරණයේදී තොරතුරු ජාල සහ පද්ධතිවල ප්‍රයෝජනය විග්‍රහ කර ගැනීමට
- පුස්තකාල හා තොරතුරු ක්ෂේත්‍රයේ පර්යේෂණවල අවශ්‍යතාව විමසා බැලීමට

හැකියාව ලැබෙනු ඇත.

## 5) පාඨමාලාවට අන්තර්ගත විෂයයන්

| HDLIM I | HDLIM II |
|---|---|
| 1. පුස්තකාල හා තොරතුරු වෘත්තියේ සංවර්ධනය | 1. පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථාන කළමනාකරණය |
| 2. එකතු කළමනාකරණය | 2. තොරතුරු ආයතන සඳහා ජාලකරණය |
| 3. ජනමාධ්‍ය සඳහා තොරතුරු | 3. තොරතුරු කළමනාකරණය-iii |
| 4. තොරතුරු කළමනාකරණය -ii | 4. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය- iii |
| 5. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය -ii | 5. ග්‍රන්ථවිද්‍යාත්මක සංවිධානය- iii |
| 6. ග්‍රන්ථවිද්‍යාත්මක සංවිධානය-ii | 6. තොරතුරු පද්ධති කළමනාකරණය |
| 7. තොරතුරු පද්ධති කළමනාකරණය | 7. පර්යේෂණ ක්‍රමවේදය |
| 8. පර්යේෂණ ක්‍රමවේදය | 8. තොරතුරු වෘත්තිකයන් සඳහා ඉංග්‍රීසි-iii |
| 9. තොරතුරු වෘත්තිකයන් සඳහා ඉංග්‍රීසි | 9. ව්‍යාපෘතිය |
| 10. ව්‍යාපෘතිය | |

**6) පාඨමාලා කාලය :**

| HDLIM I | HDLIM II |
|---|---|
| **වසර 01** | **වසර 01** |

**7) මාධ්‍ය -** සිංහල / දෙමළ

**8) පන්ති පැවැත්වීම :** දේශන මාර්ගගතව හා නිලීස් ආයතනයේදී පැවැත්වේ.

**9) ඇගයීම් ක්‍රමවේදය**

- සෑම විෂයයක් සඳහාම ලිඛිත ප්‍රශ්න පත්‍රයකට පිළිතුරු සැපයිය යුතුය. (සමස්ත ලකුණුවලින් 50% මේ සඳහා ලැබේ.)
- සෑම විෂයකට අදාළව දෙනු ලබන පැවරුම් සම්පූර්ණ කල යුතුය.(සමස්ත ලකුණුවලින් 50% මේ සඳහා ලැබේ.)
- ව්‍යාපෘතිය සම්පූර්ණ කළ යුතුය.

**10) පුස්තකාල හා තොරතුරු කළමනාකරණ උසස් ඩිප්ලෝමාව ලබා ගැනීමට නම්**

HDLIM I සහ II යන අදියර දෙකම අවසන් කළ යුතු අතර එක් අදියරක අවම වශයෙන් සියලු විෂයනට C සාමාර්ථයක් ලබා ගත යුතුය. එනම් සෑම විෂයකටම අවම වශයෙන් 50% ක ලකුණු ලබා ගත යුතුය. විෂයන් තුනක් හෝ ඊට අඩු සංඛ්‍යාවකට D හෝ E සාමාර්ථ තිබුණහොත් එම විෂයන් සඳහා පමණක් පුනර් පරීක්ෂණයට පෙනී සිටිය යුතුය.

**11) පාඨමාලා ගාස්තු**

| | HDLIM I | HDLIM II |
|---|---|---|
| අයදුම්පත්‍ර ගාස්තුව | රු.39,500.00 | රු.49,900.00 |

පාඨමාලා ගාස්තු වාරික 02 කින් ගෙවිය හැක.

**12) පාඨමාලා ආරම්භය :** 2025 අගෝස්තු

**13) අයදුම්පත්‍ර භාරගන්නා අවසන් දිනය : 2025 ජුලි 04**

**14) අයදුම් කරන ආකාරය**

I. අපගේ වෙබ් අඩවියෙන් (nilis.cmb.ac.lkඅයදුම්පත බාගත කරන්න.
II. අයදුම් පත්‍රය හැකිතාක් පැහැදිලිව පුරවන්න.
III. උප්පැන්න සහතිකයේ, උ.පෙල සහතිකයේ සහ ජාතික හැඳුනුම්පතේ පිටපත් අමුණන්න
IV. මහජන බැංකුව, තිඹිරිගස්යාය ශාඛාවේ අංක 086100101191736 දරන ගිණුමට අයදුම්පත් සැකසීමේ ගාස්තුව ලෙස රු.500.00 ගෙවා, රිසිට් පත අයදුම්පතෙහි අදාළ කොටුවේ අලවන්න.
V. නිසිලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර **2025 ජුලි 04** දින හෝ එදිනට පෙර ලැබෙන සේ පහත ලිපිනයට තැපැල් කරන්න.

"ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
ජාතික පුස්තකාල සහ තොරතුරු විද්‍යා ආයතනය (NILIS)
කොළඹ විශ්වවිද්‍යාලය
කොළඹ 03"
දුරකථන: 011 2507150 / 0701478619